ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ஸ்ரீலங்கா சீமெந்துக் கூட்டுத்தாபனம

SRI LANKA CEMENT CORPORATION

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள

ANNUAL REPORT AND ACCOUNTS

2019

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2019

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

2022.03.15

ලේකම්තුමා,
කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

<u>2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව</u>

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2019 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2019 වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තුතියි.

මෙයට විශ්වාසී,

අත්සන් කලේ,
නිතීඥ ගාමිණී ඒකනායක
සභාපති
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අන්තර්ගතය **පිටු අංකය**

01	අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	01 – 04
02	සංස්ථාව පිළිබඳ තොරතුරු	05
03	ආයතනික තොරතුරු - 2020 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය	06
04	මානව සම්පත් පිළිබඳ තොරතුරු	07
05	සභාපතිතුමාගේ වාර්තාව	08
06	ආයතනික තොරතුරු - 2019 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය	09
07	ආයතනික තොරතුරු - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව	09
08	විගණන කමිටුවේ වාර්තාව - 2019	10
09	විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2019	11 – 22
10	2019.12.31ට මූල්‍ය තත්ව ප්‍රකාශනය	23
11	2019.12. 31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	24
12	2019.12. 31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය	25
13	2019.12. 31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	26
14	2019.12.31න් අවසන් වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති	27 - 32
15	2019.12.31න් අවසන් වර්ෂයේ ගිණුම්කරණ සටහන් සඳහා සවිස්තරාත්මක සටහන්	33 – 40
16	2019 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන්	41 – 42
17	2019 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්	43 – 46
18	2014 – 2018 දක්වා වසර 5ක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය	47
19	2014 – 2018 දක්වා වසර 5ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	48

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2019 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1.0 පසුබිම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි. කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. ඉන් පසු කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ ව්‍යක්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී 2019 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

දැක්ම

"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

මෙහෙවර

"ගුණාත්මකභාවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

ප්‍රධාන පරමාර්ථ

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ.
එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දැ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම

එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලදි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර එම වර්ෂයේම දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය.

මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2016 පෙබරවාරි 25 සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරින් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය මේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් නිදහස් කරගැනීමටත් නැවත එහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමටත් කිහිපවිටකදීම උත්සාහ කලද එය නිෂ්පල විය. එසේම, ආරක්ෂක අංශයන්ගේන් මෙම ඉඩම් නිදහස් කරගැනීමෙන් අනතුරුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම ඇතුලත් වාර්තා සකස් කර ආදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :
අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභෝගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර **"කන්කේසන්"** වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි. 2008 වර්ෂයේ සිට 2012 සංස්ථාව විසින් සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 219,559ක් ආනයනය කර ඇත.

2013 සහ 2014 වර්ෂයන්හිදී සංස්ථාව විසින් සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 20,300ක් සහ මෙට්ට්‍රික් ටොන් 18,900 ක් ආනයනය කර ඇත. එසේම, සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 1,540ක් හා මෙට්ට්‍රික් ටොන් 3,815ක් පිළිවෙලින් 2015 හා 2016 යන වර්ෂ වලදී ආනයනය කර ඇත.

2017 වර්ෂයේදී සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 980ක් පමණක් ආනයනය කර අතර සිමෙන්ති අලෙවි කිරීම සඳහා පළපුරුදු සේවකයින් නොමැති වීම සහ මූල්‍යමය අපහසුතා මත සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

<u>සිමෙන්ති අලෙවිය</u>

වර්ෂය	**2018** සහ **2019**	**2017**	**2016**	**2015**
ප්‍රමාණය (මෙට්ට්‍රික් ටොන්)	-	980	4,002	2,780
වටිනාකම (රු.මිලියන)	-	12.66	60.15	37.87

(ආ) **<u>කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :</u>**

කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත. එසේම, 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වූ කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

<u>කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය</u>

වර්ෂය	2019	2018	2017	2016	2015
කොන්ක්‍රීට් කණු	-	-	-	304	-
වැටවල් සඳහා වූ කණු	-	-	4	253	391
ආර්.සී.කණු	114	99	145	169	419
කොන්ක්‍රීට් ගල්	-	-	-	46,907	54,805
වටිනාකම (රු.මිලියන)	**0.57**	**0.56**	**1.13**	**4.07**	**2.69**

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශීත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 02 දෙදෙනෙකු හැර අනෙකුත් සේවකයින් 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වත්කම්වලින් උපයන ලද කුලී ආදායම්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හුණුගල් අවශ්‍ය පුද්ගලයන් සොයා එම ඉඩම් කල්බදු පදනම මත ලබා දී හා එළඹී තිබෙන ගිවිසුම් යාවත්කාලීන කර ඉන් ආදායම් ඉපයා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.

(ඈ) ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිළිබඳ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :
සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් සංස්ථාව ස්ථායී හා කාර්ියක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හඳුනාගෙන ඊට අදාළ කටයුතු සිදු වෙමින් පවති. එසේම, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලංකා සිමෙන්ති සමාගම සමග ඒකාබද්ධ කිරීමට කටයුතු සිදු වේ. 2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වූ අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත. නැවත ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව 2015, 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 4.34ක , රු.මිලියන 31.70ක, රු.මිලියන15.61 හා රු.මිලියන15.96 ප්‍රකාශිත ගණකාධිකරණ ලාභ උපයාගෙන ඇත.

2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 39.30 ක බදු පෙර ලාභයක් උපයා ඇත. එය පෙර වසර හා සැසඳීමේදී 100.62% වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. 2019 ජනවාරි මස 01වන දින සිට බලපැවැත්වෙන පරිදි අරුවක්කාලු නිධියට අදාල බදු කුලී වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධානම හේතුව වේ. මෙම වර්ෂයේදී අනෙකුත් ගණකාධිකරණ ගැලපීම් වලින් පසු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ශුද්ධ ලාභය රු. මිලියන 43ක් වේ.

5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජුනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයන්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරීමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති “2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ” රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා සිදුවෙමින් පවතී.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මුල්‍ය තත්වය ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

6.0 සේවය ඇගයීම

2019 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාහට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් රේඛිය අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය බැංකුවල හා අනෙකුත් රජයේ ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 440 201 , 0112 440 203 හා 0112 440 205
ෆැක්ස් අංක : 0112 448 866

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුම්පිරායි, යාපනය.
දුරකථන අංක : 0213 215 340

බැංකුකරුවෝ

ලංකා බැංකුව**,** මහජන බැංකුව

විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව**,** අංක.306/72, පොල්දුව පාර**,** බත්තරමුල්ල.

පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම

ප්‍රධාන කාර්යාලය

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 447 746, 0112 399 243
ෆැක්ස් අංක : 0112 447 541

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2020 වර්ෂයේදී අලුතින් පත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

01. ගාමිණි ඒකනායක මහතා	සභාපති	-	01.01.2020 දින සිට
02. ඊ.ඒ.එස්.සුරංග මහතා	අධ්‍යක්ෂ	-	01.01.2020 දින සිට
03. ජී.එල්.චමින්ද ජයලාල් මහතා	අධ්‍යක්ෂ	-	01.01.2020 දින සිට
04. යු.එල්.ආර්.සෙනරත් පෙරේරා මහතා	අධ්‍යක්ෂ	-	01.01.2020 දින සිට
05. එස්.පී.ලොකුහැන්ඩිගේ මහතා	අධ්‍යක්ෂ	-	01.01.2020 දින සිට
06. ඩබ්.ජී.ඩී.සී.ඩී.එස්.රාජකරුණා මහත්මිය	මහාභාණ්ඩාගාර නියෝජිත	-	01.01.2020 දින සිට

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2019.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

වර්ගය	මධ්‍ය කළමණාකරන	කණිෂ්ඨ කළමණාකරන	කළමණාකරන සහකාර	ප්‍රථමික මට්ටම	එකතුව
ප්‍රධාන කාර්යාලය	01	01	03	07	12
කොන්ක්‍රීට් අංගනය	-	-	-	01	01
එකතුව	**01**	**01**	**03**	**08**	**13**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව දේශීය කාර්මික දැවැන්තයින් අතර සුවිශේෂී සලකුණක් ලෙස පිළිගැනේන අතර සංස්ථාවක් වශෙයන් ශ්‍රී ලංකාව තුල ඉතාමත් කැපී පෙනෙන ආයතනයකි. වර්තමානයේදී, සංස්ථාවේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීමට, ඌණ උපයෝජිත වත්කම් නැවත උපයෝජනය කිරීමට සහ සංස්ථා පිහිටුවීමේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ළඟා කරගැනීමට අවශ්‍ය නව ප්‍රතිපත්ති ගෙන ඒමට සංස්ථාව උත්සාහ කරයි. මෙම මෙහෙවර සංස්ථාව දියුණු කරනවා පමණක් නොව සමස්ත ජාතියම මෙම ව්‍යාපාරෙයන් ප්‍රයෝජන ලබන බවට සැකයක් නැත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් මෙය කණ්ඩායම් ප්‍රයත්නයක් බව මම තරයේ විශ්වාස කරමි. ගරු කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාතුමා, අමාත්‍යාංශ නිලධාරීන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වඩාත් කැපවූ සේවක කණ්ඩායම ගැන මට හොඳ විශ්වාසයක් ඇත. විද්‍යාත්මිකව නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම , තාක්ෂණික දියුණුව සහ වෙළෙඳපොළ අවශ්‍යතා හඳුනා ගැනීම මෙම උත්සාහය සඳහා අපට උපකාරී වනු නොඅනුමානයි. 2019 වර්ෂයේ වාර්තාව නිසි ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසුව, ජාතික සංස්ථාවක් වශයෙන් අපි එවැනි ව්‍යාපාර ආරම්භ කිරීමට ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික හැකියාවන් තුළ සිටින බවට මාහට දැඩි විශ්වාසයක් ඇත.

සමාලෝචනය කෙරෙන වර්ෂය සඳහා වූ ෙමම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සතුටට කරුණක් වන අතර ඉදිරි වසර තුළදී සංස්ථාවට නව ෙපරළයක් සිදු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

අපට ලැබුණු නොමසුරු සහයෝගය පිළිබඳව ගරු කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය වෙත ස්තුති කිරීමට මම මෙම අවස්ථාව යොදා ගනිමි. පසුගිය මූල්‍ය වර්ෂය තුල ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කාර්යමණ්ඩලයට මම ස්තුතිවන්ත වෙමි.

අත්සන් කලේ,
ගාමිණි ඒකනායක (නීතිඥ)
සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2019 වර්ෂයේදී කටයුතු කල අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

01. එම්.රියාස් සාලී මහතා	සභාපති	2018.06.25	සිට	2019.04.10
02. එස්. සුබයිර්ඩීන් මහතා	සභාපති	2019.04.10	සිට	2019.11.25
03. එස්. අබිඩීන් එහියා මහතා	කළමණාකරණ අධ්‍යක්ෂ	2016.02.16	සිට	2019.11.25
04. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2015.03.18	සිට	2019.11.25
05. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2015.03.31	සිට	2019.11.25
06. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2015.04.30	සිට	2019.11.25
07. ඩී.එස්.කොස්තා මහත්මිය	මහාභාණ්ඩාගාර නියෝජිත	2015.10.30	සිට	2019.11.25
08. එල්.ජී.නිලංග ඩී. සෝමපාල	අමාත්‍යාංශ නිරීක්ෂක	2018.07.25	සිට	2019.04.26
09. ඩබ්.එන්.ආර්.විජේකෝන්	අමාත්‍යාංශ නිරීක්ෂක	2019.04.26	සිට	2019.11.25

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක	ගණකාධිකාරී	ප්‍රධාන කාර්යාලය
02. ඊ.එස්.චාන්දනී	පිරිස් නිලධාරී	ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
විගණන කමිටුවේ වාර්තාව - 2019

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

2019 වර්ෂයේදී විගණන කමිටුවේ සභාපති ලෙස ඩී.එස්.කොස්තා මහත්මිය කටයුතු කල අතර එම්.එස්.එම්.කබීර් මහතා සහ එන්.එම් මුනාවර් මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබිණි.

මේ වන විට විගණන කමිටුවේ සභාපති ලෙස ඩබ්.ජී.ඩී.සී.ඩී.එස්.රාජකරුණා මහත්මිය කටයුතු කරනු ලබයි. ජී.එල්.චමින්ද ජයලාල් මහතා සහ ඊ.ඒ.එස්.සුරංග මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබිණි.

<u>විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.</u>

අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකූල වන ලෙස සකස්කර තිබේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත වක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලොචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම.

අත්සන් කලේ,
ඩබ්.ජී.ඩී.සී.ඩී.එස්.රාජකරුණා,
සභාපති - විගණන කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } වීසිඑම්/ඒ/එස්එල්සිසි/79/2019/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 23 දින

සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 (1) වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 1977 සැප්තැම්බර් 20 දිනැති අංක 283/2 දරන ගැසට් නිවේදනය මඟින් සංස්ථාවට පවරාදී තිබූ අක්කර 5,423 රූඩ් 2 පර්චස් 36 ක් වූ පුත්තලම අරුවක්කාලු හුණුගල් නිධිය මූල්‍ය ප්‍රකාශන වල අක්කර 5,164 රූඩ් 0 පර්චස් 25 ක් ලෙස සටහන් කර තිබුණි. වසර 50 ක කාලයක් සඳහා මෙම ඉඩමෙන් අක්කර 5153 රූඩ් 03 පර්චස් 40 ක් සමාගමක් වෙත බදු දී තිබූ මෙම ඉඩම තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1960 ජූලි 08 දිනැති අංක 12156 දරන ගැසට් නිවේදනය සහ අංක A 2099 දරන සැලැස්ම අනුව කන්කසන්තුරේ පිහිටි අක්කර 241.56 ක් සංස්ථාව වෙත 1960 ජූලි 08 දින පවරා දී තිබුණි. එම පවරා දීමට අදාළ සැලැස්මට අනුව සංස්ථාව සතුව තෙල් ටැංකි 02 ක්ද පවතින බව නිරීක්ෂණය වූ අතර, මෙම ඉඩම සහ තෙල් ටැංකි තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සංස්ථාව සතු කන්කසන්තුරේ ඉඩමේ කැණීම් කර ගොඩ ගසා ඇති හුණු ගල් ප්‍රමාණයෙන් ඝණ මීටර් 28,750 ක් වන හුණුගල් තොගය 2018 දෙසැම්බර් 06 දින සහ අංක SLAF/1028/3/10/WKS දරන ලිපිය මඟින් සංස්ථාව වෙත නිදහස් කර දී තිබුණි. වසර එකහමාරක් ක පමණ කාලයක සිට අනාරක්ෂිතව ගොඩ ගසා තිබූ මෙම හුණුගල් තොගය වටිනාකම අගය කර ගිණුම්ගත කිරීමටත්, ආරක්ෂා කිරීමට සහ ආර්ථික ප්‍රතිලාභ ලැබෙන කාර්යයකට භාවිතා කිරීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු කුළී වටිනාකම රු.3,822,724 ක් ලෙස සටහන් කර තිබූ නමුත්, විගණනයට ඉදිරිපත් කළ කුළී උපලේඛනය අනුව එම සංස්ථාවට ගෙවිය යුතු කුළී වටිනාකම රු.1,302,462 ක් වූයෙන්, එකතුව රු.2,520,262 ක් ගෙවිය යුතු කුළිය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි.

(ඉ) සංස්ථාව විසින් පුද්ගලයෙකු වෙත පැවරූ නඩුවක් මඟින් අයවිය යුතු මුදල රු.1,112,000 ක් ලෙස සටහන් කර තිබුණද, එම පුද්ගලයාගෙන් සංස්ථාවට අයවිය යුතු මුදල රු.2,730,002 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.76,862,633 ක වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තහවුරු කර ගැනීමට සහ එදිනට එකතුව රු.28,433,713 ක වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන ලිපි 2020 අගෝස්තු 15 දින දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර, එම ණය ශේෂ අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(උ) සංස්ථාව 2017/ 2018 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අඩුවෙන් ගෙවීම මත රු.678,794 ක දඩ මුදලක් ගෙවන ලෙස සංස්ථාව වෙත දැනුම් දී තිබූ අතර, එම දඩ මුදල කපා හරින ලෙස සංස්ථාව විසින් ඉල්ලීම් කළද, ඒ සඳහා ලිඛිත අවසර ලැබී නොතිබුණි. එම දඩ මුදල සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කෙටිකාලීන තැන්පතු පොළී ආදායම වූ එකතුව රු.365,655 ක් කෙටිකාලීන තැන්පතු ලෙස ගිණුම්ගත කිරීම නිසා, එම වටිනාකමින් කෙටිකාලීන තැන්පතු පොළී ආදායම අඩුවෙන්ද කෙටිකාලීන තැන්පතු වටිනාකම වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(එ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ගිණුම් 03 ක එකතු වටිනාකම රු.9,598,396 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛන අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු.6,000,122 ක් වූයෙන්, මූල්‍ය ප්‍රකාශන වල දේපළ පිරියත හා උපකරණ එකතුව රු.3,598,274 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ඒ) 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.190,642 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළී ආදායම භාණ්ඩාගාර බිල්පත් ගිණුමේ ගිණුම්ගත කිරීම නිසා ලැබිය යුතු පොළී ආදායම රු.190,642 ක් අඩුවෙන්ද, භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.190,642 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.10 කොටස් 108,361,891 ක එනම් එකතුව රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා සිමෙන්ති සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය වන විට මෙම රාජ්‍ය සමාගමේ සේවකයින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යවා සමාගම වසා දමා තිබුණි.

(ඕ) ලංකා සිමෙන්ති සමාගම 2017 දෙසැම්බර් 31 දින සිට වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකිරීම මත කොළඹ කොටස් හුවමාරුවේ අවලම්භිත සමාගමක් (Suspended) කර තිබුණ අතර, සංස්ථාව විසින් එම සමාගමේ සිදු කර තිබූ ආයෝජන 2017 වර්ෂයේ කොටසක වෙළඳපොල අගය වූ රු.5.70 ක අගය පදනම් කරගෙන 2019 මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම ලෙස එකතුව රු.617,662,779 ක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ආයෝජනයේ සත්‍ය වෙළඳපොල අගය ගිණුම් වලට ගත නොහැකි වූ අතර, ආයෝජන ගිණුම්ගත කරන ආකාරය ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේද හෙළිදරව් කර නොතිබුණි.

(ක) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 දරන ප්‍රමිතයේ 6 (ඒ) වගන්තිය ප්‍රකාරව කල්බදු ගිවිසුම් මත උපයන ආදායම් අයභාරයෙහි කොටසක් ලෙස හඳුනාගත නොහැකි වුවත්, එසේ උපයන ලද එකතුව රු.59,317,816 ක කල්බදු ආදායම් අයභාරය ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම ප්‍රමිතයේ අයභාරයට සම්බන්ධ විෂය පථයෙන් ආවරණය නොවන එකතුව රු.4,668,200 ක කුළී ආදායම්ද මූල්‍ය ප්‍රකාශනවල අයභාරය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ග) ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අංක 16 කල්බදු පිළිබඳව වූ ප්‍රමිතයේ 90 (බී) වගන්තිය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.37,934,300 ක් වූ කල් බදු ආදායමක් වෙනම හෙළිදරව් කිරීමකින් තොරව අයභාරය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ච) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 දරන ප්‍රමිතයේ 49 (a) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂවල වැරදීම් හෙළිදරව් කිරීමට හා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වුවත්, ආයෝජන දේපළක් නොවන ඉඩම් ආයෝජන දේපළක් ලෙස ගිණුම් තැබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.238,700,000 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත් කරන ලද වටිනාකම නැවත රඳවාගත් ඉපයුම් ගිණුම හර කර, ප්‍රත්‍යාගණන සංචිත ගිණුම බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඡ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 දරන දේපළ පිරියත හා උපකරණ පිළිබඳ වූ ප්‍රමිතයේ 73 (බී) වගන්තිය ප්‍රකාරව, භාවිතා කරන ක්ෂය ක්‍රමය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු සහ එම ප්‍රමිතයේ 79 (බී) වගන්තිය ප්‍රකාරව එකතුව රු.4,851,521 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කළ වර්තමානයේදී භාවිතා කරනු ලබන වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ට) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 104 වගන්තිය සහ සේවක ප්‍රතිලාභ පිළිබඳ අංක 19 දරන ප්‍රමිතයේ අංක 25 සහ 158 දරන වගන්ති ප්‍රකාරව කෙටිකාලීන හා දිගුකාලීන සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් එහි ස්වභාවය සහ ඒ පිළිබඳව වන අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, එකතුව රු.1,781,738 ක් වූ සේවක ප්‍රතිලාභ වැය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඩ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම පිළිබඳව වූ ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වුවත්, වර්ෂයේ සත්‍ය මුදල් ගළා යාම සහ සත්‍ය මුදල් ගළා ඒම නොසලකා හැර, ප්‍රමිතයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් ලිඛිත පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ණ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව එකතුව රු.3,684,059 ක් වූ පෙර වර්ෂයේ ගැළපීම් වටිනාකම සමුච්චිත රඳවාගත් ඉපයුම් ගිණුමේ සහ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ ආරම්භක ශේෂයට ගැළපීම් කළ යුතු වුවත්, එම වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ ලාභයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2019 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂයේ ලාභය රු.3,684,059 කින් වැඩියෙන්ද සමුච්චිත රඳවාගත් ඉපයුම් ගිණුමේ ආරම්භක ශේෂය වූ අලාභය එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ත) සංස්ථාවේ 1990 වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් අංක 036980 දරන රු.335,249 ක ඉන්වොයිස් පත්‍රය නිකුත් කර තිබුණි. එම වටිනාකම 2019 දෙසැම්බර් 31 දින දක්වා ගෙවීමට හෝ ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. සංස්ථාවේ 2004 වර්ෂය සඳහා වන විගණන ගාස්තුව රු.188,258 ක් වූ අතර, ඒ සඳහා එකඟතාවය ඵල නොකිරීම නිසා ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබුණි. එම ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වෙන් කිරීම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ), (ආ), (ඊ), (එ), (ඕ) සහ (ත) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාවට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/ විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 260 සහ 264	වවුචර් පත්‍ර භාවිතා කර ගෙවීම් කිරීමේදී චෙක්පත හෝ මුදල් භාරගත් බවට සහ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සහ ආදායකයාගෙන් මුදල් ලද බවට කුවිතාන්සියක් ලබාගත යුතු වුවත්, ගෙවීම් වවුචර් පත්‍ර 72 ක් භාවිතා කර එකතුව රු.3,559,008 ක ගෙවීම් කිරීමේදී වවුචරය මත අත්සනක් හෝ ගෙවීම් ලද බවට කුවිතාන්සියක් රහිතව ගෙවීම් කර තිබූ අතර, අදාළ චෙක්පත් ආදායකයාගේ ඉල්ලීම මත ආයතනය විසින්ම බැංකුගත කර තිබුණි.
(ආ) 2018 නොවැම්බර් 14 දින අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	මෙම වක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සංස්ථාව විසින් 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.19,261,864 ක් සහ 2020 ජනවාරි මස රු.51,500,000 ක් රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.
(ඇ) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛයේ 5 (2) වගන්තිය	මෙම වක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, 2016 වර්ෂයේ සිට සංස්ථාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. **අනෙකුත් විගණන නිරීක්ෂණ**

(අ) 1996 අගෝස්තු 23 දින අත්සන් කළ අංක 495 දරන අරුවක්කාලු හුණු ගල් නිධිය සහිත ඉඩම සමාගමකට බදු දීමට අදාළ බදු ගිවිසුමේ කොන්දේසි කිහිපයක් 2019 නොවැම්බර් 07 දින අත්සන් කළ අංක 268 දරන අතිරේක බදු ගිවිසුමෙන් සංශෝධනය කර තිබුණි. ඒ අනුව සංශෝධිත බදු කුළිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.58,021,840 ක් වාරික දෙකකින් සංස්ථාව ලබාගෙන තිබුණි. නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය රහිතව එළඹී මෙම අතිරේක බදු ගිවිසුමෙහි 1993 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලයට අදාළව වැඩි විය යුතු බදු කුළිය පිළිබඳව සඳහන් නොකිරීම නිසා එම කාලයට අදාළ බදු මුදලෙහි වැඩිවීම් සංස්ථාවට අහිමි වී තිබුණි. තවද, බදු කුළිය වැඩි වීමේ ප්‍රතිශතය සියයට 12 ක් ලෙසත්, 2019 වසර සඳහා සංශෝධිත බදු කුළිය ඇමරිකානු ඩොලර් 319,318 ක් ලෙසත් සඳහන් කළ සංස්ථාවට අවාසිදායක ගිවිසුමකට, නීතිපතිවරයාගේ අනුමැතියක්ද රහිතව 2019 නොවැම්බර් 07 දින සංස්ථාවේ හිටපු සභාපතිවරයා අත්සන් තබා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සංස්ථාව සතු වත්කම් කළමනාකරණය හා ඵලදායී කාර්යයන් වල ආයෝජනය කිරීම මඟින් ආදායම් ඉපයීම සංස්ථාවේ කාර්යය මණ්ඩලය වෙත පැවරුණු කාර්යය භාරය විය. නමුත්, සංස්ථාවේ පසුගිය වර්ෂවල ක්‍රියාකාරිත්වය මත පුද්ගලයන් සහ ආයතන 13 ක් වෙතින් 2019 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.14,752.739 ක් සංස්ථාව වෙත අයකරගත යුතුව තිබුණි. එම මුදල් අයකර ගැනීම සඳහා විවිධ අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමු වී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම මුදල් අයකර ගැනීමට ඉහළ කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව සතු කොල්ලුපිටිය ඉඩම බැංකුවකට උකස් කර ලබාගෙන තිබූ මුළු ණය මුදල රු.97,700,000 ක් විය. එම ණය මුදල 2018 ජූනි 25 දින බැංකුව විසින් උපලේඛන ගත කර තිබූ අතර, එම ණය වෙනුවෙන් 2019 වර්ෂය තුළ ණය වාරික ලෙස එකතුව රු.24,000,000 ක් ද, ණය පොළී ලෙස රු.11,539,256 ක් ද ගෙවීම්

කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.73,700,000 ක හිඟ ණය මුදලක් ගෙවිය යුතුව තිබුණි. ඒසේ හිඟ ණය පියවීමට තිබියදී 2019 දෙසැම්බර් 31 දිනට රු.19,261,864 ක් සහ 2020 ජනවාරි මස රු.51,500,000 ක් ණය පොළියට වඩා අඩු පොළී ආදායම් ලබා ගැනීම සඳහා එම මුදල් ලිඛිත අවසරයකින් තොරව රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි.

(ඇ) කන්කසන්තුරේ පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 02 ක් සහ නල පද්ධතිය රාජ්‍ය සමාගමක් වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පරිහරණය සඳහා ලබාදී තිබුණි. 2019 සැප්තැම්බර් 09 දින රේඛීය අමාත්‍යාංශයේදී පැවති රැස්වීමකදී මේ සඳහා ගාස්තු ගෙවිය යුතු බවට නිගමනය කර ගාස්තු ගෙවන ලෙස අදාළ පාර්ශවයන් වෙත දැනුම්දී තිබුණි. නමුත්, සංස්ථාව සතු හෙක්ටයාර් 2.4281 ක් වූ මෙම ඉඩම 2019 පෙබරවාරි 08 දින අංක 2110 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් වාණිජ කටයුත්තක් සඳහා පරිහරණය කරන රාජ්‍ය සමාගම වෙත බදු දීමට ක්‍රියා කරන බව නිවේදනය කර තිබුණි. එම ගැසට් නිවේදනය ඵල කර වසරකට වැඩි කාලයක් ගතවී තිබූ අතර, සංස්ථාව සතු මෙම ඉඩම පැවරීමේ ගැටලුව නිරවුල් කර ගැනීමටත්, තෙල් ටැංකි හා ඉඩම පරිහරණය සඳහා ලිඛිත ගිවිසුමකට අනුව ලබාදීමටත් එම රාජ්‍ය සමාගම පරිහරණය කළ කාලයට අදාළව ගාස්තුව වන එකතුව රු.151,320,000 ක වටිනාකම අයකර ගැනීමටත් සංස්ථාවේ කළමනාකරණය මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් රු.1,200,000 කට හෙක්ටයාර් 2.3103 ක් වූ ඉඩමක් ගාල්ල උණවටුන ප්‍රදේශයෙන් 1989 පෙබරවාරි 22 දින මිලදීගෙන තිබුණි. ඵලදායී කාර්ය්‍යකට යොදා නොගෙන නිෂ්කාර්ය්‍ය වත්කමක් ලෙස තිබූ මෙම ඉඩම සුනාමියෙන් විපතට පත් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා හබරාදුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කටයුතු කර තිබුණි. සංස්ථාවට අයත් වූ මෙම දේපළ භාවිතා කිරීමට අදාළව නීතිමය පියවර ගැනීමටත්, සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු වන්දි මුදලක් ලබා ගැනීමටත් කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි.

(ඊ) සංස්ථාව සතු පර්චස් 89.07 ක කොල්ලුපිටියේ පිහිටි ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 17 දින රු.735,000,000 කට තක්සේරු කර තිබුණි. විශාල මූල්‍ය හා ආර්ථික වටිනාකමකින් යුතු මෙම ඉඩම සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව සහ විධිමත් ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව ආයතන 07 කට වාහන ගාල් කිරීම සඳහා ලබාදී තිබුණි. ඒ අනුව 2019 වර්ෂය තුළ එකතුව රු.5,077,401 ක කුළී ආදායමක් උපයාගෙන තිබූ අතර, නිශ්කාර්ය්‍යව පැවති මෙම ඉඩම වඩා ඵලදායී ආයෝජනයකට යෙදවීමට ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් මහවැලි මෙරින් සිමෙන්ති පුද්ගලික සමාගමේ එකතුව රු.6,400,000 ක් කොටස් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කර තිබුණි. එම ආයෝජන සඳහා 2014 වර්ෂයේදී පමණක් ප්‍රතිලාභ ලැබී තිබූ අතර, ඉන් පසුව කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වටිනාකම ගිණුම්ගත කළ ආකාරය සහ ආයෝජනයට අදාළ කොටස් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2019 දෙසැම්බර් 31 දිනට

වත්කම්	සටහන්	2019 ශ්‍රී.ල.සි.ස. රු.	2018 ශ්‍රී.ල.සි.ස. රු.
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**03**	797,731,556	1,457,296
ආයෝජන දේපල	**04**	-	796,950,000
විකිණීම සඳහා තිබෙන වත්කම්	**05**	750,000	-
දිගුකාලීනව ලැබිය යුතු දෑ	**06**	-	-
වෙනත් ආයෝජනයන්	**07**	630,769,134	630,226,056
		1,429,250,690	1,428,633,352
ජංගම වත්කම්			
තොගය	**08**	238,256	925,486
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**09**	76,862,633	72,999,219
මුදල් හා මුදල් සමාන දෑ	**10**	26,944,605	19,867,979
		104,045,494	93,792,684
මුළු වත්කම්		**1,533,296,184**	**1,522,426,036**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		966,971,845	966,971,845
පොදු සංචිත		9,996,952	9,996,952
ප්‍රත්‍යාගණන සංචිත		561,202,984	561,202,984
රඳවාගත් ඉපැයුම්		(138,864,838)	(181,898,802)
විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත		(465,956,132)	(465,956,132)
ශ්‍රී.ල.සි.ස. හිමිකම් දරන්නන්ට අදාළ මුළු හිමිකම		**933,350,811**	**874,629,812**
සුළු කොටස් හිමිකාරිත්වය		-	-
මුළු හිමිකම		**933,350,811**	**890,316,847**
ජංගම නොවන වගකීම්			
පොලී ගෙවිය යුතු දිගුකාලීන වගකීම්	**11**	67,700,000	93,700,000
දිගුකාලීනව ගෙවිය යුතු දෑ	**13**	492,426,190	492,426,190
විශ්‍රාම පාරිතෝෂික අරමුදල	**14**	4,674,578	4,012,838
		564,800,768	**590,139,028**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**15**	28,433,713	36,823,993
පොළී ගෙවිය යුතු කෙටිකාලීන වගකීම්	**11**	6,000,000	4,000,000
උපචිත බැංකු ණය පොළී	**12**	710,892	1,146,168
		35,144,605	**41,970,161**
මුළු වගකීම්		**599,945,373**	**632,109,189**
මුළු හිමිකම් හා වගකීම්		**1,533,296,184**	**1,522,426,036**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

අත්සන් කලේ,
එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක - ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

අත්සන් කලේ,
ජී.එල්.වමින්ද ජයලාල් - අධ්‍යක්ෂ

අත්සන් කලේ,
ගාමිණි ඒකනායක - සභාපති

විස්තීරණ ආදායම් හා රදවා ගත් ඉපැයුම් ප්‍රකාශනය

2019 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

	සටහන්	**2019** **ශ්‍රී.ල.සි.ස.** **රු.**	**2018** **ශ්‍රී.ල.සි.ස.** **රු.**
ආදායම්	**16**	63,306,817	36,064,670
විකුණුම් පිරිවැය	**Sta. I**	(565,129)	(316,271)
දළ (ලාභය)/ අලාභය		**62,741,688**	**35,748,399**
වෙනත් ආදායම්	**17**	7,045,189	15,375,443
බෙදාහැරීම් වියදම්	**Sta. II**	-	-
පරිපාලන වියදම්	**Sta. III**	(18,897,716)	(16,882,861)
මූල්‍ය වියදම්	**18**	(11,539,256)	(14,652,301)
බදු පෙර ලාභය	**19**	**39,349,905**	**19,588,680**
බදු පිරිවැය		-	(3,630,250)
වර්ෂයට අදාළ ලාභය		**39,349,905**	**15,958,430**
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)		-	-
පෙර වර්ෂ සඳහා ගැලපීම්	**21**	(3,684,059	(271,396)
මුළු විස්තීරණ ආදායම්/(වියදම්)		**43,033,964**	**15,687,034**
වර්ෂ ආරම්භයේ රදවාගත් ඉපැයුම් හා විකිණීම සඳහා වූ සංචිත		(647,854,934)	(663,541,968)
වර්ෂ අවසානය රදවාගත් ඉපැයුම් හා විකිණීම සඳහා වූ සංචිත		**(604,820,970)**	**(647,854,934)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2019 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව	01.01.2018 දිනට ශේෂය	2018	පුනප්‍රකාශිත 31.12.2018 දිනට ශේෂය	2019	31.12.2019 දිනට ශේෂය
ප්‍රකාශිත ප්‍රාග්ධනය	966,971,845	-	966,971,845	-	966,971,845
ප්‍රත්‍යාගණිත සංචිත	561,202,984	-	561,202,984	-	561,202,984
පොදු සංචිත	9,996,952	-	9,996,952	-	9,996,952
රඳවාගත් ඉපැයුම්	(197,585,836)	15,687,034	(181,898,802)	43,033,964	(138,864,838)
විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත	(465,956,132)	-	(465,956,132)	-	(465,956,132)
මුළු එකතුව	**874,629,813**	**15,687,034**	**890,316,847**	**43,033,964**	**933,350,811**

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්		2019 ශ්‍රී.ල.සි.ස. රු.		2018 ශ්‍රී.ල.සි.ස. රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්					
වර්ෂයට අදාළ බදු පෙර ලාභය			39,349,905		19,588,680
මුදල්මය නොවූ ආදායම්/(වියදම්) ගැලපීම :					
ක්ෂය වෙන්කිරීම්	උ.ලේ. D	97,040		132,216	
පාරිතෝෂික වෙන්කිරීම්	උ.ලේ. D	661,740		322,533	
බැංකු ණය පොලී	උ.ලේ. D	11,539,256		14,652,301	
සේවක ණයවලට අදාළ පොළී	16	3,763,396		-	
තැම්පත්වලට අදාළ පොළී	16	(2,680,534)		(1,618,681)	
භාණ්ඩාගාර බිල්පත්වලට පොළී	16	(543,079)		(473,744)	
දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය	උ.ලේ. D	-	12,837,819	(10,065,512)	2,949,113
			52,187,724		22,537,793
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වූ වෙනස්කම්					
තොගයේ සිදු වූ අඩුවීම්/(වැඩිවීම්)			687,230		316,271
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැහි වූ අඩුවීම්/(වැඩිවීම්)			(3,863,413)		1,444,458
ගෙවිය යුතු බැංකු ණය පොළිහි වූ වැඩිවීම් /(අඩුවීම්)			-		(1,052,102)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දැහි වූ වැඩිවීම් /(අඩුවීම්)			(8,390,279)		(9,891,731)
			40,621,262		13,354,689
අඩුකිරීම් :					
පාරිතෝෂික ගෙවීම්			-		-
පොළී ගෙවීම්			(12,053,870)		(3,842,234)
බදු ගෙවීම්			(2,595,701)		(247,480)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්			25,971,691		9,264,975
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්					
තැම්පතුවල ආයෝජනය කිරීම්			(46,700,000)		(35,000,000)
තැම්පතු මුදල් කර ගැනීම්			48,510,055		19,741,164
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්			(171,300)		-
භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනයන්			-		(1,271,367)
භාණ්ඩාගාර බිල්පත්වලට අදාළ පොලී ලැබීම්			-		1,271,367
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්			1,638,755		(15,258,836)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්					
ණය හා අනෙකුත් ණය පහසුකම් පියවීම්			(24,000,000)		(93,352)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්			(24,000,000)		(93,352)
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දැහි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)			3,610,446		(6,087,213)
මුදල් හා මුදල් සමාන දැහි වර්ෂ ආරම්භක ශේෂය			3,070,355		9,157,568
බැංකුගත මුදල්හි වර්ෂ අවසාන ශේෂය			6,680,801		3,070,355
එකතු කළා : කෙටිකාලීන මුදල් තැම්පතු			20,263,804		16,797,624
මුදල් හා මුදල් සමාන දැහි වර්ෂ අවසාන ශේෂය			**26,944,605**		**19,867,979**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

1.සාමාන්‍ය තොරතුරු

කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව වර්ෂ 1945 ජූලි මස 29 වන දින ස්ථාපිත කරන ලද අතර ඒහි නම "කන්කසන්තුරේ සිමෙන්ති කම්හල" නම් විය.

මෙම සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. 1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි.

මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා තිබූ අතර ඒය අංක 27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් විදිය, ෙකාළඹ 02 යන ස්ථානයේ 2015 ජූලි මස සිට ස්ථාපිත කර ඇත.

ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සඳහන් වේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

2.1.මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත අතර එය ආසන්න රුපියලට වටයා ඇත.

2.1.1.දිගුකාලීන පැවැත්ම

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු අතර ආයතනය ඈවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

2.2.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්

2.2.1.පරිපාලිතයන්

1981 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.

2017 වර්ෂයේදී මෙහි කොටසක වෙළඳපොළ අගය රු.5.70ක් වූ අතර මෙවන විට කොටස් හුවමාරු සිදු නොවන බැවින් කොළඹ කොටස් හුවමාරුවේහි ඒහි වටිනාකමක් ප්‍රකාශ නොකෙරේ.

කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

2.2.2.ආශ්‍රිතයන්

ලෆාජ් මහවැලි සිමෙන්ති (පෞද්ගලික) සමාගමේ සාමාන්‍ය කොටස් 320,000ක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ අතර 1995.12.31 දින ඊට අදාළව සාමාන්‍ය කොටස් දෙකක් සඳහා ඒක් ප්‍රසාද කොටසක් නිකුත් කරන ලදි. වර්තමානය වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ඒහි සාමාන්‍ය කොටස් 480,000ක හිමිකාරීත්වය දරනු ලබයි. ඒය සාමාන්‍ය කොටස් හිමිකාරීත්වෙය් ප්‍රතිශතයක් ලෙස 10%කි.

2016 සැප්තැම්බර් 15 වන දින මෙම සමාගමේ නම මහවැලි මෙරීන් සිමෙන්ති (පෞද්ගලික) සමාගම ලෙස වෙනස් කර ඇත.

ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්, විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම් යටතේ ඉදිරිපත් කර ඇත. විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වලට අදාලව හඳුනාගනු ලබන හානි කරන අලාභයන් , හිමිකම් යටෙත් ප්‍රකාශිත සාධාරණ අගය මත ඒකතුවී තිබෙන වෙන්කිරීම් හා ලාභඅලාභ ගිණුමට හඳුනාගනු ලැබේ.

ආශ්‍රිතයන්හි කරන ලද මෙම ආයෝජනයන් සඳහා ලාභාංශ ලැබීමක් ඒය ලැබීමට අයිතිය සංස්ථාවට ලද විට හඳුනාගැනීම සිදු කරන අතර ඒය වෙනත් ආදායම් යටතට නිරූපණය කරනු ලැබේ.

2.2.3 සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ වූ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - එල්.කේ.ඒ.එස්. 24 (සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්) වලට අනුව, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (කේ.එම්.පී.) යනු ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීමේ අධිකාරිය සහ වගකීම දරන අයයි.ඉහත නිර්වචනයට අනුව, ඉහත දැක්වූ නිර්වචනයේ සඳහන් ක්‍රියාකාරකම් තුනම සිදු කිරීමේ අධිකාරිය සහ වගකීම යන දෙකම නොමැති නම් පුද්ගලයෙකු කේ.එම්.පී. ලෙස සැලකිය නොහැකිය.

2.3.අයභාරය හඳුනාගැනීම

සිමෙන්ති මළු මිලදී ගැනීම සහ විකිණීම හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම සහ විකිණීම යන ක්‍රියාකාරකම් තුලින් වූ ආදායම් හඳුනාගෙන සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ඡේදයට අදාල ප්‍රමාණය මිනුම් කර වාර්තා කිරීමේ කාලය අවසානයේදී හඳුනාගනු ලැබේ. ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු වල සාධාරණ වටිනාකමෙනි. ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කෙරේ.

2.3.1. භාණ්ඩ විකිණීම

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානම හා එවායේ අයිතිය ගැනුම්කරු වෙත පැවරීමෙන් පසුව වේ.

2.3.2. පොලී

කාල අනුපාතය පදනම් කර ගනිමින් මෙම පොලී ආදායම් හඳුනාගනු ලබනුයේ වත්කම්වලට අදාල සළුල පොලී අනුපාතය සැලකිල්ලට ගනිමිනි.

2.3.3.වෙනත්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ.

2.4.ණය පිරිවැය

යම් කාලපරිච්ඡේදයක් තුල දරණ ලද ණය සඳහා වූ පිරිවැය එම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.5.ආදායම් බදු

ආදායම් බදු පිරිවැය නියෝජනය කරන්නේ දැනට ගෙවිය යුතු බද්දේ එකතුවයි.
දැනට ගෙවිය යුතු බද්ද වර්ෂය සඳහා බදු අය කළ හැකි ලාභය මත පදනම් වේ.

2.6.දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.
ක්ෂය විම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදී අදාල වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.
ක්ෂය ගණනයේදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

විස්තරය	**ක්ෂය අනුපාතය**
ගොඩනැගිලි	6.67%
යන්ත්‍ර සුත්‍ර	12.5%
පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ	25.0%
මොටර් රථ වාහන	25.0%
මෙවලම් හා උපකරණ	25.0%
ලී බඩු හා සවිකිරීම්	25.0%
රේල් පීලි	10.0%

වත්කමට අදාල ක්ෂය අනුපාතයන්හි ඵලදායී ජීව කාලයෙහි හෝ අවශේෂ පිරිවැයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වේ නම් එම වත්කම ක්ෂය කිරීම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.
රු.10,000/-ට අඩු වටිනාකමක් සහිත දේපල පිරියත උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හා එය මිලදී ගනු ලැබූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

2.7. වත්කම් ගවේශණය කිරීම සහ ඇගයීම

ශ්‍රී ලංකා ජනරජය විසින් 1977 සැප්තැම්බර් මස 20 වන දින නිකුත් කරන ලද අංක: 283/2 දරණ ගැසට් පත්‍රය මඟින් අක්කර 5,164 රූඩ් 0 පර්චස් 25කින් යුත් බණිජ නිධියක් සහිත ඉඩම ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇත.
මෙම සම්පූර්ණ ඉඩම වසර 50ක කාලයකට 1993වසරේදී පුත්තලම සිමෙන්ති (පෞද්ගලික) සමාගමට සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය හුණුගල් කැණීම් කිරීම සඳහා බදු ගිවිසුමක් යටතේ බදු දී ඇති අතර ඒහි නාමය හොලිසීම් ලංකා (පෞද්ගලික) සමාගම ලෙස වෙනස් කල අතර වර්තමානය වන විට සියාම් සිටි සිමෙන්ති ලංකා (පෞද්ගලික) සමාගම ලෙස භාවිතා කරනු ලැබේ.
මෙම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

2.8.විකිණීම සඳහා වූ වත්කම්

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව යුද්ධය පැවති කාලයට පෙර මෙහෙයුම් කටයුතු සඳහා මෙම දුම්රිය මෙහෙයුම් මැදිරි භාවිතා කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - එල්.කේ.ඒ.එස්. 16 හි වූ ප්‍රතිපාදනයන්ට අනුව වලට අනුව, සාධාරණ අගය මත පදනම්ව ඒහි වටිනාකම හඳුනාගෙන තිබෙන අතර ජංගම නොවන වත්කම් යටතේ වූ විකිණීම සඳහා තබා ඇති වත්කම් පංතිය වෙත මෙය මාරු කර ඇත. මෙම වත්කමට අදාළ සාධාරණ අගයෙහි වැඩිවීමක් සිදු වූ විටදී, ඒම වත්කමට අදාළව මීට පෙර හඳුනාගෙන තිබෙන හානිකරණ අලාභ වෙන්කිරීම් ගිණුමට හා ලාභඅලාභ ගිණුමට හඳුනාගනු ලබන අතර ඉතිරියක් වේනම් ඒය වෙනත් විස්තීරණ ආදායම් යටතට හා හිමිකම් යටතේ වූ ප්‍රත්‍යාගණන සංචිතයට හඳුනාගනු ලැබේ.

2.9. තොගය

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.
එනම් තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත්මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කිරීමෙනි.
පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

2.9.1. කන්කසන්තුරේ තිබෙන කැණීම් කරන ලද හුණුගල්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පලාලී ගුවන් ධාවනපථය සකස් කිරීමේදී කැණීම් කර ඉතිරි වී තිබූ හුණුගල් සංස්ථාවට භාරදී ඇත. ඒහි ඇගයීම කටයුතු සිදු ෙවමින් පවතී. ඒහි ප්‍රමාණ හයක පමණ ඒකතුවක් පවතින අතර මුළු තොගය ඝනමීටර 25,750කි. මෙය තක්සේරු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ෙනාමැත.

2.10. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය පදනම යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ඇති වන මෙම වගකීම් පොලී අය කිරීමකින් තොර වේ.
විදේශීය ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් ශී ලංකා රුපියල් වලට පරිවර්ථනය කර ගිණුම්ගත කරන ඇතර ඉන් ඇති වන විදේශීය මුදල් හුවමාරු ලාභ / (අලාභ) වේ නම් එය වෙනත් ආදායම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.11.බැංකු ණය හා අයිරා පහසුකම්

බැංකු ණය හා අයිරා පහසුකම් සඳහා වන පොලී ගණනයේදී සළුල පොලී අනුපාතයන් පදනම් කර ගනු ලබන අතර එය මූල්‍ය වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.12.වෙන්කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය තත්ව ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනට යම් කරුණක් සම්බන්ධව වගකීමක් ඇතිවේනම් හෝ ඊට අදාළව සම්පත් ගලායාමට සම්භාවිතාවයක් තිබේනම් හා එම සම්පත් ගලායෑම ඇස්තමේන්තු කල හැකි නම් ඊට අදාළව වෙන්කිරීම් සිදු කල යුතු වේ.

ආයතනයේ සම්පත් ගලායෑමේ ප්‍රවණතාවයක් නොමැති වුවද සියලුම අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.

ආයතනය තුලට සම්පත් ගලාඒමේ ප්‍රවණතාවයක් වේනම් පමණක් අසම්භාව්‍ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වෙළඳ ලැබිය යුතු වටිනාකම් වෙනුවෙන් අධිකරණයේ නඩු දහතුනක් (13) ගොනු කර ඇත.

නඩු අංකය	ගොනු කරන ලද වර්ෂය	වගකිවයුතු පාර්ශවය	හිමිකම (රු.)
වෙළඳ			
47146/MR	2003	යූ.ඒන්.අෙබ්ෙස්කර	679,500.00
56783/MR	2003	අාර්.ඒම්.පී.ඩී.ඒම්.රාජපක්ෂ	1,656,000.00
47175/MR	2003	ෙක්.ඒ.ෙජ්.ජයන්ත ෙපෙර්රා	110,500.00
000262/08	2003	නිව් අයිලන්ඩ් හාර්ඩ්ෙවයාර්	198,000.00
56780/MR	2003	වින්සර ෙබදාහරින්නන්	195,400.00
56781/MR	2003	ප්‍රසන්න කන්ස්ට්‍රක්ෂන්ස්	92,250.00
000260/08	2003	මයන්ත ෙට්ඩර්ස්	65,508.00
56782/MR	2003	අාර්.ඒ.ඒස්.ෙක්.රාජපක්ෂ	810,683.60
IR 324/03/11	2011	ෙල්කා ෙපෙර්රා	1,112,000.00
90302	2012	ඒ.ඒ.ඒ.මවුලානා	663,800.00
CID	2003	පී.ඒම්.ෙක්.ෙසෙනවිරත්න	6,000.00
CID	2003	අයි.ඩී.ටී.චන්ද්‍රසිරි	5,000.00
CID	2015	අාර්.සී.සී. ෙට්ඩින්	6,655,795.00
Others			
13365 – Vehicle	2013	බී.ඒම්.සුගතදාස	
BR 232 – Land	2012	පුත්තලම ඉඩම්හි අනවසර පදිංචිකරුවන්	
B/312/PC/2014	2014	යාපනය, රජෙය් ෙද්පළ වංචාව	

2.12.2. තෙල් ටැංකි සංකීර්ණය සඳහා ලැබිය යුතු බදු කුලි

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඉදිකර භාවිතා කරන ලද ටැංකි 5 කින් යුත් තෙල් ටැංකි සංකීර්ණය 1990 ට පෙර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ලදි. යුද සමයේ සිට සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සිය මෙහෙයුම් කටයුතු සඳහා මෙම තෙල් ටැංකි සංකීර්ණය භාවිතා කරනු ලැබේ. මෙම ටැංකි සඳහා කුලී ගෙවීම සම්බන්ධව අදාළ පාර්ශවයන් සමඟ පැවති සාකච්ඡාවලදී, 2010 සිට කුලී ගෙවීමට තීරණයක් ගත් අතර මෙම ටැංකි සඳහා කුලී වශයෙන් කිසිදු මුදලක් ගෙවා නොමැත. 2019 දෙසැම්බර් 31 දින වන විට එම සමාගමෙන් ලැබිය යුතු මුදල රු. 151,320,000/- ක් වූ නමුත් එම පාර්ශවයන් සමඟ තවමත් කිසිදු ගිවිසුමකට එළඹ නැත.

2.13. සේවක ප්‍රතිලාභ

2.13.1. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සඳහා වන වගකීමේ අදාළව වාර්තා කරන දිනයේ දී වූ වර්තමාන වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශය තුල හඳුනාගතයුතු වන බව පිළිගනී.

සංස්ථාවේ සේවකයින්ට අදාළ ප්‍රතිපාදන සැලසෙන්නේ ඔවුන්ගේ වැටුප්, දීමනා සහ වාර්තාකරන දිනය දක්වා වූ ේසවා කාලය පදනම් කරගෙන ය. සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වගකීම් ගණනය කිරීමේදී පැන නගින යම් යම් ලාභ හෝ අලාභ වෙනම් ඒය වෙනත් විස්තීරණ ආදායම් හෝ වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම සිදු කරනුයේ සංස්ථාව තුළ වසර 5 කට අඩු අඛණ්ඩ සේවා කාලයක් ඇති සියලුම සේවකයින් ඇතුළුවය.

කෙසේ වෙතත්, පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සේවකයෙකුට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ඇති වගකීම පැන නැඟෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය අවසන් වූ පසුව පමණි. සේවකයින්ට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සපුරාලීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් සිදු කර ඇත.

2.13.2.සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල
සියලුම සේවකයින්ගේ සේවක අර්ථසාධක සඳහා පදනම් වන වැටුප මත සංස්ථාවේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ලෙස 10% ක් ද, සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ලෙස 12% ක් ද, සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය ලෙස 3% ක් ද දායක වේ.

2.13.3.වෛද්‍ය පහසුකම් සඳහා වූ යෝජනා ක්‍රමය
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද අනුමත සීමාවන් තුළ ප්‍රතිලාභයක් වශයෙන් සංස්ථාව විසින් සේවකයින් සඳහා වෛද්‍ය බිල්පත් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරේ. මෙම යෝජනා ක්‍රමය සඳහා වූ දායක මුදලක් සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කෙරේ.

03. දේපල, පිරියත හා උපකරණ

පිරිවැය	2019.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂය තුල වූ එකතු කිරීම්	වර්ෂය තුල වූ අඩු කිරීම්	2019.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	1,595,981	796,200,000	-	-	797,795,981
මෝටර් රථ	4,562,891	-	-	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	4,575,575	-	171,300	-	4,746,875
මේවලම් හා උපකරණ	288,630	-	-	-	288,630
	11,023,077	**796,200,000**	**171,300**	**-**	**807,394,377**

සමුච්චිත ක්ෂය වෙන්කිරීම්	2019.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂයට අදාළ ක්ෂය කිරීම්	වර්ෂයට අදාළ ඉවත්කිරීම්	2019.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	395,981	-	-	-	395,981
මෝටර් රථ	4,562,891	-	-	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	4,318,279	-	97,040	-	4,415,319
මේවලම් හා උපකරණ	288,630	-	-	-	288,630
	9,565,781	**-**	**97,040**	**-**	**9,662,821**
ශුද්ධ පොත් අගය	**1,457,296**				**797,731,556**

මෙහි දක්වා තිබෙන මෝටර් රථ සහ මේවලම් හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. නමුත් මේවන තුරු ඒවා භාවිතා කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අක්කර 751කින් යුතු ඉඩමක් කන්කසන්තුරේ පිහිටා තිබෙන අතර එම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොමැත.

මෙම මුළු ප්‍රමාණයෙන් අක්කර 241ක් පිඹුරුපත් අංක ඒ 2099 යටත් රජයෙන් ලද ඉඩමක් වන අතර එය අංක : 12,156 දරණ 1960 ජූලි 08වන දිනැති ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇත. කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව, එහි පරිපාලන ගොඩනැගිලි හා තෙල් ටැංකි සංකීර්ණය මෙම භූමි ප්‍රමාණය තුල ඉදිකර ඇත.ඉතිරි ප්‍රමාණය වන අක්කර 520ක ප්‍රමාණය පිඹුරුපත් අංක ඒ1557, ඒ1484, ඒ1562 හා ඒ2438 හි ඇතුලත් වන අතර එය 1964 අංක 14,012දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැසට් පත්‍ර යේ වගන්ති අංක 460 යටතේ වන්දි ගෙවා අත්පත් කරගෙන ඇත.

උතුරු පළාත සංවර්ධනය කිරීමට අදාළ වැඩසටහන් හා සම්බන්ධව ජනාධිපති කාර්යසාධන බලකාය විසින් එම වැඩසටහන් සඳහා ඉහත සඳහන් ඉඩම් යොදාගැනීමේ හැකියාව පිළිබඳව සාකච්ජා පවත්වන ලදී. එම ඉඩමෙන් කොටසක් ලබා දෙන ලෙස විවිධ ආයතන වලින් ලද ඉල්ලීම් හා රට තුල අවතැන් වූ පුද්ගලයන්හට ලබාදෙන ලද ඉඩම් ප්‍රමාණයන් හා අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී තිබෙන ඉඩම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

ආයතනයේ නම	ප්‍රමාණය (අක්කර)	වෙනත් කරුණු
ශ්‍රී ලංකා යුධ හමුදාව	50	මෙම ඉඩම් වන්දි ලබාගැනීම යටතේ එම ආයතන සඳහා නිදහස් කිරීම සඳහා වූ අනුමැතීන් පිළිබඳව 2019.02.29 දින වාණිජ්‍ය හා කර්මාන්ත කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා දැනුවත් කරන ලදි.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	50	
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	06	
ගැසට් පත්‍රයක් මගින් රට තුල අවතැන් වූ පුද්ගලයන්හට	45	
අනවසරයෙන් පුද්ගලයින් පදිංචි වී තිබෙන ඉඩම් ප්‍රමාණයන්	50	
පරිසර හිතකාමී කර්මානතපුරය සඳහා	330	2018.09.10 වන දින මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පිහිටා තිබෙන හිමිකම් ඔප්පු අංක :2354 යටතේ සංස්ථාව සතු වූ ඉඩම අක්කර 06කින් යුක්තවේ. සංස්ථාවේ අනුමැතියකින් තොරව සුනාමි නිවාස , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුල් වී ඉදිකර ඇති බැවින් මීට සුදුසු වන්දි මුදලක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

කොල්ලුපිටියේ පිහිටි පර්චස් 87.9කින් යුතු ඉඩම , ලංකා රජය විසින් 1967 ජූලි මස 12වන දින නිකුත් කල ගැසට් අංක : 14,756/7 මගින් සංස්ථාව වෙත ලබා දී ඇත. මෙම ඉඩම 2013 හා 2017 යන වර්ෂවලදී පිළිවෙළින් රු.712,500,000/-ක් හා රු.735,000,000/-ක් ලෙස ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇත. මෙම ඉඩම උගස් බැඳුම්කර අංක.2426 යටතේ රු.172,000,000/-ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමට 2008.02.25 වන දින උගස් කර ඇත.

මෙම ඉඩමේ වටිනාකම ආයෝජන වත්කම් යටතේ 2018 වර්ෂය දක්වා ඇත. 2019 වර්ෂයේ සිට මෙහි වටිනාකම දේපල, පිරියත හා උපකරණ සටහෙනහි ඉඩම් යටතේ නිරූපණය කර ඇත.

ශ්‍රී ලංකා සමෙන්ති සංස්ථාවට අයත් අක්කර 12 : රූඩ් 3: පර්චස් 30කින් යුත් පුත්තලම පාලාවිහි පිහිටි ඉඩම සියාම් සිටි සිමෙන්ති සමාගමට කල්බදු පදනම මත අත්සන් කරන ලද ගිවිසුම් අංක : 26 යටතේ 2003.06.06 දින ලබා දී ඇත.

පුත්තලම පාලාවිහි පිහිටි අක්කර 221කින් යුතු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු ඉඩමේ අක්කර 170 : රූඩ් 3: පර්චස් 28.3ක් 2013 වර්ෂයේදී තක්සේරු කල අතර එය ගිණුම්ගත කර ඇත. ඉතිරි අක්කර 51ක ප්‍රමාණය තක්සේරුකර ගිණුම්ගත කර නොමැත.

		2019	2018
04.	**ආයෝජන දේපල**	**රු.**	**රු.**
	ඉඩම - කොළඹ 03	-	735,000,000
	ඉඩම - පාලාවි	-	61,200,000
	දුම්රිය මෙහෙයුම් මැදිරි	-	750,000
		796,950,000	**796,950,000**

මෙහි දක්වා තිබූ ආයෝජන වත්කම්හි වටිනාකම 2019 වර්ෂයේ සිට විකිණීම සඳහා වෙන්කර තිබෙන වත්කම් යටතේ සටහන් කර ඇත.

05.	**විකිණීම සඳහා වෙන්කර තිබෙන වත්කම්**		
	දුම්රිය මෙහෙයුම් මැදිරි	750,000	-
		750,000	-
06.	**දිගුකාලීනව ලැබියු යුතු දෑ**		
	ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වූ දෑ	360,311,323	424,169,977
	ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වූ අභ්‍යන්තර ගනුදෙනු සඳහා ලැබිය යුතු වූ දෑ	396,912,560	333,053,906
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම්	(757,223,883)	(757,223,883)
		-	-
07.	**ආයෝජනයන්**		
	භාණ්ඩාගාර බිල්පත්	6,706,355	6,163,277
	පරිපාලිතයන් සහ ආශ්‍රිතයන්ගේ ආයෝජනයන්		
	පරිපාලිත - ලංකා සිමෙන්ති සමාගම	617,662,779	617,662,779
	ලෆාජ් සිමෙන්ති (පෞද්.) සමාගම	6,400,000	6,400,000
		630,769,134	**630,226,056**
08.	**තොගය**		
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ අමුද්‍රව්‍ය හා නොනිමි වැඩ	238,256	238,256
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ නිමි තොගය	-	687,230
		238,256	**925,486**

		2019	2018
		රු.	රු.
09.	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**		
	වෙළඳ ණයගැතියෝ	49,072,035	49,425,414
	අඩමාණ ණය වෙන් කිරීම්	(977,166)	(977,166)
	ලැබිය යුතු කුලී	2,376,670	2,515,440
	දේශ්‍රීය ඇණවුම් මත කලින් ලැබීම්	1,131,622	1,131,622
	ලැබිය යුතු තැම්පත්	1,624,626	1,624,626
	සිමෙන්ති මත ලැබිය යුතු තැම්පත්	976,971	976,971
	සේවක ආපදා ණය/මෝටර් බයිසිකල් ණය හා අනෙකුත්	3,692,332	2,061,696
	කලින් ගෙවූ වියදම්	403,203	278,601
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ	1,253,580	1,253,580
	විවිධ අත්තිකාරම්	240,948	240,947
	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ	48,000	48,000
	ලැබිය යුතු එකතු කල අගය මත බදු	9,935,654	10,414,117
	ලැබිය යුතු ආර්ථික සේවා ගැස්තු	126,758	126,758
	ලැබිය යුතු රදවාගත් බදු	5,523,571	2,748,462
	ලැබිය යුතු ආදායම් බදු	761,123	-
	එන්.එච්.ඩී.ඒ. ආයතනයෙන් ලැබිය යුතු දෑ	672,706	672,706
		76,862,633	**72,999,219**

09.1 සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ලැබිය යුතු දෑ

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සම්බන්ධිත පාර්ශ්වයක් වන ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු රු.1,253,580/-ක මුදල වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑහි සටහන් කර ඇත.

10.	**මුදල් හා මුදල් සමාන දෑ**	**2019**	**2018**
	බැංකුවේ තිබෙන මුදල්	රු.	රු.
	- ලංකා බැංකුව, ලේක් වීව් ශාඛාව	1,698,236	1,332,786
	- ලංකා බැංකුව, ආයතනික ශාඛාව	2,375,937	19,594
	- මහජන බැංකුව, ලිබර්ටි ප්ලාසා ශාඛාව	2,606,628	1,717,975
	කෙටිකාලීන බැංකු තැම්පතු	20,263,804	16,797,624
		26,944,605	**19,867,979**

11.	**පොළී ගෙවිය යුතු වගකීම් - බැංකු ණය**			
	ලංකා බැංකුව, ණය අංකය - 83124176	-කෙටිකාලීන	6,000,000	6,000,000
		-දිගුකාලීන	67,700,000	93,700,000
			73,700,000	**97,700,000**

2017.10.10 වන දින සංස්ථාව විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව ලංකා බැංකුවට ගෙවිය යුතුව තිබූ රු. 97,700,000/-ක බැංකු පහසුකම් මාස 120ක නැවත ගෙවීම් කිරීමේ කාලයක් සහිත ණය අංකය - 83124176 යටතේ නැවත සකස් කරන ලදි.

12.	**ගෙවිය යුතු බැංකු ණය පොළී**		
	ගෙවිය යුතු බැංකු ණය පොළී	710,892	1,146,168
		710,892	**1,146,168**

13.	**දිගුකාලීන වගකීම්**		
	භාණ්ඩාගාර අත්තිකාරම්	492,426,190	492,426,190
		492,426,190	**492,426,190**

14.	**විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම්**		
	වර්ෂ ආරම්භක දිනට විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය	4,012,838	3,795,861
	වර්ෂය තුල ණය මත කල කපාහැරීම්	-	(105,556)
		4,012,838	3,690,305
	වර්ෂයට අදාළ වෙන්නිරීම්	661,740	322,533
	වර්ෂ අවසාන දිනට විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය	**4,674,578**	**4,012,838**

		2019 රු.	2018 රු.
15.	**වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	වෙළඳ ණයහිමියෝ	3,090,311	3,090,311
	සිමෙන්ති අත්තිකාරම්	1,079,410	1,079,410
	උපචිත වියදම්	3,008,221	3,816,615
	බී.සී.සී. ආයතනයට ගෙවිය යුතු කුලී	766,150	766,150
	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු කුලී	3,822,724	6,322,724
	ගෙවිය යුතු තැම්පතු	1,253,126	1,329,176
	ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	126,756	126,756
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	1,984,046	1,946,818
	වැටුප් පාලන ගිණුම	185,755	140,754
	නොගෙවූ වැටුප්	51,645	51,645
	රදවාගත් කාසි	468	468
	ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්	129,103	104,484
	ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්	17,711	14,354
	ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂික	2,287	31,631
	ගෙවිය යුතු ආදායම් බදු	-	5,217,349
	ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	-	3,445
	ගෙවිය යුතු එකතු කල අගය මත බදු	12,907,750	12,773,488
	ගෙවිය යුතු රදවා ගැනීම් මත බදු	8,250	8,415
		28,433,713	**36,823,993**

		2019 රු.	2018 රු.
16.	**ආදායම්**		
	සිමෙන්ති විකුණුම්	-	-
	කොන්ක්‍රීට් කණු විකුණුම්	576,431	579,569
	භූණුගල් නිධිය සහිත ඉඩමෙන් ලැබෙන කල්බදු	59,182,276	31,703,734
	ඉඩම්වලින් ලැබෙන කුලී ආදායම්	4,803,740	4,503,870
	(-) ජාතිය ගොඩනැගීමේ බදු	(1,255,630)	(722,503)
		63,306,817	**36,064,670**
17.	**වෙනත් ආදායම්**		
	සේවක ණය මත ලද පොලී	169,035	143,481
	තැම්පතු මත ලද පොලී	2,680,534	1,618,681
	භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	543,079	473,744
	ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	-	-
	විවිධ ආදායම්	25	25
	සාණ්ඩාගාර ලැබීම්		-
	ඉඩමට ඇතුල්වීමේ ගාස්තු	3,652,516	3,074,000
	බැංකු ණය පොළී කපාහැරීම්	-	10,065,512
		7,045,189	**15,375,443**
18.	**මූල්‍ය වියදම්**		
	බැංකු අයිරා පොලී	-	6,559
	බැංකු ණය පොලී	11,539,256	14,645,742
		11,539,256	**14,652,301**
19.	**බදු පෙර ලාභය**		
	බදු පෙර ලාභය ගණනයේදී පහත සඳහන් වියදම් අඩුකර ඇත:		
	සේවක පිරිවැය	9,203,294	8,860,320
	අධ්‍යක්ෂ පාරිතෝෂික	3,531,187	3,463,365
	ක්ෂය වෙන්කිරීම්	97,040	132,216
	විගණන ගාස්තු	520,000	520,000
	තොග හානි	122,101	-
	පාරිතෝෂික වෙන්කිරීම්	661,740	322,533

20. තොග හානි

මෙම රු.122,101/-ක තොග හානිය හඳුනාගනු ලැබුවේ හානි වී තිබූ මීටර් 6.0 හා 6.7 දිගින් යුතු ආර්.සී. කණු සහ වැටවල් සඳහා යොදාගනු ලබන කණුවලට අදාලව වේ.

21.	**රදවාගත් ඉපැයුම් සඳහා කරන ලද පෙර වර්ෂ ගැලපීම්**	රු.	
	2018/12/31 දිනට රදාගත් ඉපැයුම්		(647,854,934)
	මුදල් හා මුදල් සමාන දෑ - කෙටිකාලීන තැම්පතු	208,516	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂික	(9,180)	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු උපචිත වියදම්	(22,355)	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	(33,635)	
	වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ - ගෙවිය යුතු ආදායම් බදු	3,630,250	
		(10,200)	
	ගෙවිය යුතු බැංකු ණය පොලී	(79,338)	
			3,684,058
			(644,170,876)

මෙම මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි මස 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල අතර නිකුත් කිරීමටද අනුමැතිය ලබාදෙන ලදි.

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	යොමුව	2019 රු.	2018 රු.
ආදායම		63,306,817	36,064,670
විකුණුම් පිරිවැය	අ	(565,129)	(316,271)
දළ අලාභය		**62,741,688**	**35,748,399**
වෙනත් ආදායම්	ආ	7,045,189	15,375,443
බෙදාහැරීම් වියදම්	ඇ	-	-
පරිපාලන වියදම්	ඈ	(18,897,716)	(16,882,861)
මූල්‍ය වියදම්වලට පෙර ලාභය		**50,889,161**	**34,240,981**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන
2019 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2019	2018
අ. විකුණුම් පිරිවැය		
	රු.	රු.
සිමෙන්ති අලෙවිය		
ආරම්භක තොගය	-	-
මිලදී ගැනුම් හා සෘජු පිරිවැය	-	-
අඩුකිරීම් : අවසාන තොගය	-	-
	-	-
කොන්ක්‍රීට් කණු අලෙවිය		
ආරම්භක තොගය	687,230	1,003,501
මිලදී ගැනුම්	-	-
සෘජු පිරිවැය	-	-
අඩුකිරීම් : අවසාන තොගය	(122,101)	(687,230)
	316,271	316,271
	565,129	**316,271**
ආ. වෙනත් ආදායම්		
සේවක ණය මත ලද පොලී	169,035	143,481
තැම්පතු මත ලද පොලී	2,680,534	1,618,681
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	543,079	473,744
ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	-	-
විවිධ ආදායම්	25	25
සාණ්ඩාගාර ලැබීම්	-	-
කුලී ආදායම්	3,652,516	3,074,000
බැංකු ණය කපාහැරීම්	-	10,065,512
	7,045,189	**15,375,443**
ඇ. බෙදාහැරීම් වියදම්		
මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම්	-	-
දැන්වීම් හා ප්‍රදර්ශන වියදම්	-	-
	-	-
ඈ. පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	6,766,499	6,376,038
අතිකාල ගෙවීම්	331,916	225,133
සේවක අර්ථසාධක අරමුදල් වියදම්	822,378	709,680
සේවක භාරකාර අරමුදල් වියදම්	205,595	177,420
වෛද්‍ය නිවාඩු සඳහා කල ගෙවීම්	401,751	362,611
අධ්‍යක්ෂ පාරිතෝෂික වියදම්	3,531,187	3,463,365
විගණන කමිටු රැස්වීම් වියදම්	119,000	196,000
වාර්ෂික ප්‍රසාද මුදල්	147,150	189,900
වෛද්‍ය පහසුකම්	42,556	72,082
තේ සඳහා වූ දීමනාව	234,950	157,838
	12,602,982	**11,930,067**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන

2019 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2019**	**2018**
	රු.	රු.
පෙර පිටුව	**12,602,982**	**11,930,067**
ආහාර දීමනාව	457,100	366,300
සුභසාධන වියදම්	570,854	404,233
නිවාස ණය මත පොලී ප්‍රතිපූර්ණය කිරීම	61,745	8,985
ලීබඩු හා සවිකිරීම් ක්ෂය	97,040	129,346
මෙවලම් හා උපකරණ ක්ෂය	-	2,870
කුලී වියදම්	1,008,150	1,009,800
විදුලි බිල්පත් වියදම්	250,778	176,872
තැපැල් හා දුරකථන වියදම්	168,303	227,296
මුද්‍රණ හා ලිපිලේඛන වියදම්	212,551	285,882
වරිපනම් ගාස්තු	6,930	7,700
පොදු වියදම්	758,907	378,567
ගමන් ගාස්තු වියදම්	38,853	89,979
ඉඩම් නීරික්ෂන හා අනෙකුත් වියදම්	176,206	-
මෝටර් රථ වියදම්	268,921	266,686
ලේකම් කටයුතු සඳහා වූ වියදම්	63,680	90,204
කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම්	50,426	80,360
ප්‍රකාශන වියදම්	9,330	10,730
විගණන ගාස්තු	520,000	520,000
පාරිතෝෂික වෙන් කිරීම්	661,740	322,533
ජල වියදම්	58,252	52,469
තොග හානී	122,101	-
බැංකු ගාස්තු	88,674	63,298
ලීබඩු හා සවිකිරීම් අලුත්වැඩියා වියදම්	2,495	-
කාර්යාල අලුත්වැඩියා වියදම්	1,650	39,000
නීති හා වෘත්තිය ගාස්තු	-	5,000
තාවකාලික සේවකයින් සඳහා වූ වියදම්	640,048	414,684
	18,897,716	**16,882,861**

ආදායම් බදු ගණනය

2019 තක්සේරු වර්ෂය සඳහා

	යොමුව		+රු.	-රු.
2019 වර්ෂයට අදාළ ලාභය	**P & L**		39,349,905	
තැම්පතු මත ලද පොළී	**P & L**			2,680,534
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොළී	**P & L**			543,079
ප්‍රාග්ධන දීමනාව	**Sch. I**			104,115
ක්ෂයකිරීම්	**P & L**		97,040	
සේවක පාරිතෝෂිත වෙන්කිරීම්	**P & L**		661,740	
සේවක පාරිතෝෂිත ගෙවීම්	**P & L**			-
			40,108,685	**3,327,728**
ගැලපීම් කරන ලද ලාභය				**36,780,957**
පොළී ආදායම				3,223,613
මුළු ව්‍යවස්ථාපිත ආදායම්				**40,004,570**
තක්සේරු කල හැකි ආදායම				**40,004,570**
අඩුකිරීම් :				
2018 සිට ඉදිරියට ගෙන එනු ලබන අලාභය		77,086,528		
2019 වර්ෂයේ අලාභය		-		
ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%		(40,004,570)		**(40,004,570)**
2020 වර්ෂයට ගෙන යනු ලබන අලාභය		**37,081,958**		
බදු වන ලාභය				-
මුළු ආදායම් බදු වියදම		-	28%	-

2018 සිට ඉ/ගෙ රඳවා ගැනීමේ බදු	206,595
2019ට අදාළ රඳවා ගැනීමේ බදු	4,734,053
	4,940,648
වැඩිපුර ගෙවූ ආදායම් බදු	761,123
ඉදිරියට ගෙන යාහැකි බදු නිදහස්	**5,701,771**

ආදායම් බදු ගණනය
2019 තක්සේරු වර්ෂය සඳහා

උපලේඛනය **I** - ප්‍රාග්ධන දීමනාව	අනුපාතය **%**	පිරිවැය	**2018** දීමනාව
2018 වර්ෂය සඳහා	-	-	-
2012 ට පෙර වර්ෂ සඳහා			
ගොඩනැගිලි	6.67%	395,981	26,412
මොටර් රථ	20%	6,650,714	-
ලීබඩු හා සවිකිරීම්	20%	546,564	-
මෙවලම් හා උපකරණ	12.5%	47,330	5,916
			32,328
2019 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	171,300	34,260
			34,260
2018 වර්ෂය සඳහා			-
2017 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	140,561	9,375
මෙවලම් හා උපකරණ	12.5%	7,750	517
			9,892
2016 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	91,497	18,299
මෙවලම් හා උපකරණ	12.5%	30,255	3,782
			22,081
2015 වර්ෂය සඳහා			
මෙවලම් හා උපකරණ	12.5%	18,180	2,273
			2,273
2014 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	135,727	-
මෙවලම් හා උපකරණ	12.5%	26,245	3,281
			3,281
2019 වර්ෂයට අදාළ ප්‍රාග්ධන දීමනාව			**104,115**

<u>ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2019 දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම.</u>

1. මූල්‍ය ප්‍රකාශන

1.2 මතය සඳහා පදනම

(අ) පුත්තලම පිහිටි හුණුගල් නිධිය සහිත ඉඩම තක්සේරු කිරීම සඳහා 2017 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මි 22,985,800ක මුදලක් ඉල්ලුම් කල අතර , එම මුදල ගෙවීමට තරම් මූල්‍ය ශක්තියක් ඒ වන විට සංස්ථාව සතු නොවීය.

නැවතත් 2020.06.30 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉහත සඳහන් ඉඩම තක්සේරු කිරීම සඳහා ගෙවිය යුතු තක්සේරු ගාස්තුව වාරික මගින් ගෙවීමට හැකි ආකාරය විමසමින් ලිපියක් යැවීමට කටයුතු කර ඇත.

(ආ) මෙම ඉඩම් 1990 ජුනි මස යුධ වාතාවරණය නිසා කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ඇණ සිටීම සමග ආරක්ෂක අංශ අතට පත්ව ඇති අතර මේ දක්වා ආරක්ෂක අංශ එම ඉඩම් හා ගොඩනැගිලි පරිහරණය කරනු ලබයි. එම ඉඩම් මුදාහරින බව ආරක්ෂක අංශ විසින් දැන්වුවද මේ දක්වා මුදා හැර නොමැත. එහෙයින් ප්‍රායෝගිකව මෙම ඉඩම තක්සේරු කිරීම අපහසු වී ඇත.

(ඇ) කැණීම් කර ගොඩ ගසා තිබෙන හුණුගල් ටෙන්ඩර් කර විකිණීම සඳහා 2019.09.26 දින පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ උපදෙස් මත මෙම හුණුගල් තොගය අගය කිරීම සිදු කිරීමට නියමිතව තිබුනි.

නමුත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නව සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2020.03.09 වන දින කන්කසන්තුරෙහි පිහිටි හුණුගල් නිධියෙහි කැණීම් කර ගොඩ ගසා තිබෙන ස්ථානයට ගිය අතර එම තොගයෙන් විශාල ප්‍රමාණයක් කිසියම් පිරිසක් විසින් ඉවත් කර ගෙන ඇති බව නිරීක්ෂනය විය .
එබැවින්ඉතිරිව ඇති හුණුගල් විකිණීමෙන්ලැබියහැකි ආදායම ප්‍රායෝගිකව අඩුවිය හැකි බැවින් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර වෙන්දේසි කිරීමට කටයුතු කරන හුණුගල් ප්‍රමාණය දැනටඅඩු ප්‍රමාණයක් බැවින් එම කමිටුවඅහෝසි කිරීමට 2020.06.16 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී.

එමෙන්ම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නව කළමණාකාරිත්වය විසින් ඉහත සඳහන් කැණීම් කරන ලද ඉතිරි හුණුගල් යොදාගනිමින් නව ව්‍යාපෘතියක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම තුලින් මෙම හුණුගල් වඩාත් ඵලදායී ලෙස භාවිතා කර ආර්ථික ලාභඋපයා ගත හැකි බවටද සාකච්ඡා කර ඇත.

එමෙන්ම මෙම හුණුගල් ආරක්ෂාකර ගැනීමේ අරමුණින් එහි වැටක් ඉදි කිරීමට කටයුතු කරන ලදී.

(ඈ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවෙහි 2019.12.31 දිනට ගෙවිය යුතු ගිණුම් යටතෙහි පවතින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටගෙවිය යුතු ලෙජර් ගිණුමෙහි ශේෂය වන රු.3,822,724 තුළ 2015 වර්ෂයේ ජුනි මස දක්වා අප විසින් ගෙවිය යුතු කුලී වෙන් කිරීම සිදුකර ඇත.

නමුත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් අප විසින් ගෙවිය යුතු කුලී මුදල තහවුරු කරමින් අප වෙත ලිපියක් එවන ලද අතර ඒ අනුව 2012.12.31 දක්වා පමණක් වූ කුලිය ගෙවිය යුතු ලෙස එහි ඇතුලත් කර ඇත. (ඇමුණුම 01)

අප විසින් විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් එවන ලද ලිපිය පදනම් කරගනිමින් මාසිකව රු.250,000.00 බැගින් ගෙවිමට සකස් කරනු ලැබූ ලේඛනය වේ.

(ඉ) එම හෙළිදරව් කිරීම සිදු කර ඇත්තේ 2011.03.24 දින වංචා විමර්ශන කාර්යාංශයට කල අයි.ආර් 160/11 දරන පැමිණිල්ල පදනම් කර ගනිමින් වේ.

2011.06.13 දින නැවත රු.3,842,002.00 ක වටිනාකමින් යුත් අගය සඳහා පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවට සනාථ වන ලිපියක් 2014.10.27 දින ලැබී ඇත.ඒ පිළිබඳ සංශෝධිත නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඊ) අප හට වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි අයිතමයන් සඳහා අප විසින් ශේෂ සනාථ ලිපි යොමුකර ඇත. එම ලිපි සඳහා අදාළ පාර්ශවයන්ගෙන් අප හට පිළිතුරක් 2020.09.04 දින වන තුරු ලැබී නොමැත.

(උ) එම දඩ මුදල කපා හැරීම සඳහා ඉල්ලුම් කර ඇත.එමනිසා එම මුදල ගෙවීමට හෝ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොමැත.

(ඌ) මින් ඉදිරියට තැන්පතු සඳහා අදාළ ගිණුම් වර්ෂය තුළ කල් පිරීම සිදු වූ අවසාන දිනයේ සිට එම ගිණුම් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළ පොළිය තැන්පතු වටිනාකම යටතේ නොදක්වා ලැබිය යුතු පොළී අදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරමු.

(එ) ආයතනයේ දේපළ පිරියත හා උපකරණ විස්තර ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛණය 2016 වර්ෂයේදී පිළියෙළ කරන ලද අතර හඳුනාගැනීමට හැකි වූ අයිතමයන් හා ඒවායේ පිරිවැය පමණක් එහි ඇතුලත් කර ඇත.වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වූ පිරිවැය එහි සඳහන් කර නොමැත. හැකි තාක් සොයා බලා ආයතනය සතුවූ විස්තර අනුව මෙම ස්ථාවර වත්කම් ලේඛණය සකස් කල අතර 2016 වර්ෂයේ සිට නිසි පරිදි නඩත්තු කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.

(ඒ) භාණ්ඩාගාර බිල්පත් 2019 වර්ෂය තුළ අවසන් වරට කල් පිරීම සිදු වූයේ 2019.08.10 දින වූ අතර එදින සිට 2019.12.31දින දක්වා අප විසින් හඳුනාගෙන ඇති පොළිය රු.190,642/- වේ.

මින් ඉදිරියට ගිණුම් වර්ෂය අවසාන දිනට කල් පිරීම සිදු නොවන තැන්පතු සඳහා කල් පිරීම සිදු වූ අවසාන දිනයේ සිට දෙසැම්බර් 31 දිනට අදාළ පොළිය ලැබිය යුතු පොළී අදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කරමු.

(ඔ) 2020 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනයේ ලංකා සිමෙන්ති සමාගමට අදාළ ආයෝජන ගිණුම් තැබීමේදී වර්තමාන අගය සැළකිල්ලට ගනිමින් ඊට අදාළ වූ හෙළිදරව් කිරීම සිදු කරනු ලැබේ.

(ඕ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම විසින් 2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ මේ වන තුරු (2020.09.04) ඉදිරිපත් කර නොමැති බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කල නොහැකි විය.රේඛීය අමාත්‍යාංශය මගින් 2019.08.27 දින පවත්වන ලද රැස්වීමේදී ලංකා සිමෙන්ති සමාගම ඈවර කිරීම සඳහා තීරණය කර ඇත.

(ක) 2016.10.20 වන දින එවකට අප රේඛීය අමාත්‍යාංශය වූ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී පැවති “2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනාක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ” රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් අප දැනුවත් කරන ලදී.

ඒ අනුව රටේ ක්ලින්කර් නිධියන්හි භාරකාරිත්වය සංස්ථාව සතු වන හෙයින් සංස්ථාවේ ඉතිරි සේවකයින් 14 දෙනා පමණක් යොදවා බදු කුලිය නිර්ණය, කන්කසන්තුරේ ඇතුලු ඉතිරි ඉඩම් සඳහා බදු කුලීකරුවන් සොයා ගැනීම, බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම ආදී කටයුතු සිදු කර ,එම ආදායමෙන් සේවක ගෙවීම් සිදු කරන ලෙසට දක්වා ඇත.

ඉහත කරුණු පදනම් කර ගනිමින් 2019 වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශනයේ අයහාරය යටතේ අංක 495 ,26 හා 268 ට අදාළ කල් බදු ගිවිසුම් යටතේ ලද ආදායම් හා කොල්ලුපිටිය ඉඩමේ පවත්වාගෙන යනු ලබන රථගාලෙන් ලද ආදායම් දක්වා ඇත.

(ග) ඉහත සඳහන් (ක) පිළිතුර අදාළ වේ.

(ව) 2020 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී මෙම වරද නිවැරදි කර ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ජ) මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 17 ,18 හා 21 තුළ මේ පිළිබඳව විස්තරාත්මකව දක්වා ඇත. ඉදිරියේදී ගිණුම් පිළියෙළ කිරීමේදී සම්පූර්ණයෙන් ක්ෂය කළ වර්තමානයේදී භාවිතා කරනු ලබන වත්කම් පිළිබඳ විස්තරාත්මක හෙළිදරව් කිරීමක් සිදු කරනු ලැබේ.

(ට) පිටු අංක 26 හි සටහන් D යටතේ කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

(ඩ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ඉදිරියේදී මුදල් ප්‍රවහ ප්‍රකාශය පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ණ) ඉදිරියේදී ගිණුම් පිළියෙළ කිරීමේදී පෙර වර්ෂයේ ගැළපීම් වටිනාකම සමුච්චිත රදවාගත් ඉපයුම් ගිණුමේ සහ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ ආරම්භක ශේෂයට ගැලපීම සිදු කරනු ලැබේ.

(ත) 1990 වර්ෂයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත්ව පුත්තලම,රුහුණ, කන්කසන්තුරේ හා මට්ටක්කුලිය මලු කම්හලද පැවතිය අතර එම සියලු ආයතන එකවර විගණනය කල අතර ඒ සඳහා වූ විගණන ගාස්තුව අප හට පමණක් දැරිය නොහැක. එමෙන්ම එම වර්ෂ සඳහා අදාළ ලිපි ලේඛන සොයා ගැනීම ඉතා අපහසු වී ඇත.
2004 වර්ෂය සඳහා වූ විගණන ගාස්තු සඳහා එවකට පැවති අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම පිළිබඳව තහවුරු කර ගැනීම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වන අප හට අපහසු වේ .ඉන්වොයිසියක් නොමැතිව ගෙවීම් කටයුතු කිරීම හෝ ගිණුම් ගත කිරිමද කල නොහැක.

(ද) ඉදිරියේදි ගිණුම් පිළියෙළ කිරීමේදී මේ සඳහා අදාළ වූ හෙළිදරව් සිදු කරනු ලැබේ. ලාභාංශ ගෙවීම පිළිබඳ මහවැලි මෙරින් සිමෙන්ති පුද්ගලික සමාගමෙන් එවන ලද ලිපිය මේ සමග අමුණා ඇත.(ඇමුණුම 01)

2 නීති රීති විධානයට යොමුව

(අ) ආදායකයාගේ ඉල්ලීම මත ආයතනය විසින්ම බැංකු ගත කිරීමේදී තැන්පතු පත වව්චරයට අමුණා ඇත. එමෙන්ම වෙක්පත් හෝ මුදල් භාරගත් බවට කුවිතාන්සියක් වව්චරයට ඇමිණීමට හා භාරගත් බවට අත්සන ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ආ) 2019 වර්ෂයට අදාළව ලද ආදායමෙන් ඉතිරි වූ මුදල් හා 2020 වර්ෂයට ලද සම්පූර්ණ ආදායම රාජ්‍ය බැංකුවක ස්ථාවර තැම්පතු ලෙස තැම්පත් කර මාසික වියදම් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් අපගේ ලිපි අංක : HO/1/5 හා 2020.01.09 දිනැති ලිපිය මඟින් සිදු කර ඇත.

(ඇ) සංස්ථාවේ 2019 වර්ෂයට අදාළ වාර්ෂික අවසාන ගිණුම් සකස් කර 2020.02.27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. නව අධ්‍යක්ෂක මණ්ඩලයේ පළමු රැස්වීම වූ එහිදී 2020.02.28 දිනට පෙර වාර්ෂික අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාපති තුමන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී.නමුත් මෙම ගිණුම් වැඩිදුර අධ්‍යනය කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදීම ඊලග අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම දක්වා කල් තබන ලදී. නමුත් රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.2020.06.16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද පසුව 2019 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ස්වෙච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත වී නොමැති අතර අභ්‍යන්තර විගණන සැලසුම පිළියෙළ කර නොමැත.

මේ සම්බන්ධව අවස්ථා කිහිපයකදී රේඛීය අමාත්‍යාංශය දැනුවත් කර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී විගණන අංශයක් ස්ථාපිත කර ඊට අදාළ කාර්යයන් සිදු කිරීමට අදාළ කටයුතු කරනු ලැබේ.

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2019 නොවැම්බර් මස 07 දින අත්සන් තබන ලද 268 දරන අතිරේක කල්බදු ගිවිසුම පිළිබඳ නව සභාපතිතුමන් විසින් රේඛීය අමාත්‍යාංශයේ ඇමතිතුමන්ගේ උපදෙස් පරිදි පොලිස් මූලස්ථානය වෙත භාර දීමට කටයුතු කර ඇත.

(ආ) මෙම නඩු සම්බන්ධව ආයතනයේ නව කළමණාකාරිත්වයේ අවධානය යොමු වූ අතර එම සියලුම ලිපිගොනු නැවත අධ්‍යයනය කර හිඟ මුදල් අය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

(ඇ) ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ පවතින මෙම ණය පියවීම සඳහා බැංකුව සමග එකඟතාවයකට පැමිණ ඇත.ඒ අනුව මෙම ණය පියවීමේ කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම අප විසින් ස්ථාවර තැන්පතු පවත්වා ගනිමින් එම මුදල් වලින් ආයතනයේ වියදම් කටයුතු හා ණය ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) තෙල් ටැංකි සඳහා රජයේ තක්සේරුව ලබා දී ඇත. මේ පිළිබඳ රැස්වීම් කිහිපයක් පැවති අතර රේඛීය අමාත්‍යාංශය තුළ 2020.05.22 දින පැවති රැස්වීමේදී අදාළ කුළී මුදල ඉදිරි දින 14 ක කාලයක් තුල ගෙවන පොරොන්දුව මත රැස්වීම අවසන් වුවද 2019.09.04 දින දක්වා අදාළ මුදල් ලැබී නොමැත.

(ඈ) අවස්ථා කිහිපයකදී නඩුව මෝසමක් මගින් ගැනීමට කටයුතු කිරීමට පෙරකලාසිය අයදුම් පත ඉදිරිපත් කර ඇත. මා විසින් 2020.07.04 දින නීතිඥ තුමිය සමග කල දුරකථන සංවාදයේදී එතුමිය විසින් කියා සිටියේ පෙරකලාසිය මාගේ අත්සනින් යුතුව එතුමිය වෙත එවන ලෙස වේ. ඒ අනුව පෙරකලාසිය යැවීමෙන් පසු මෝසමක් මගින් නඩුවේ ඉදිරි පියවර ගන්නා බව දන්වන ලදී.

(ඉ) මෙම ඉඩම ඵලදායි ව්‍යාපෘතියකට යොදා ගැනීමට සාකච්ඡා කරමින් සිටී. එතෙක් මෙම ඉඩමෙහි තාවකාලිකව වාහන රථ ගාලක් පවත්වාගෙන යනු ලබයි.

(උ) වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන වල පිටු 2019අංක හි 17 සටහන් අංක 2.2.3 හි සහ පිටු අංක 22 හි සටහන් අංක 07 මගින් එම පැහැදිලි කිරීම දක්වා ඇත.

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2014 සිට 2018 දක්වා වූ වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට

			පුනප්‍රකාශිත	
	2018	**2017**	**2016**	**2015**
වත්කම්	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**
ජංගම නොවන වත්කම්				
දේපල පරියත හා උපකරණ	1,457	1,590	3,887	4,173
ආයෝජන වත්කම්	796,950	796,950	773,700	773,700
දිර්ඝකාලීනව ලැබිය යුතු දෑ	-	-	-	757,224
ආයෝජනයන්	624,063	624,063	624,063	862,458
මූල්‍ය වත්කම්	6,163	5,689	5,162	35,469
	1,428,633	**1,428,292**	**1,406,812**	**2,433,024**
ජංගම වත්කම්				
තොගය	925	1,241	3,099	8,594
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	72,999	74,469	89,212	80,551
ඉදිරියට කල ගෙවීම්	-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ	19,868	9,158	13,687	8,743
	93,793	**84,868**	**105,998**	**97,838**
මුළු වත්කම්	**1,522,426**	**1,513,160**	**1,512,810**	**2,530,863**
හිමිකම් හා වගකීම්				
හිමිකම්				
කොටස් ප්‍රාග්ධනය	966,971	966,971	966,971	966,971
පොදු සංචිතය	9,997	9,997	9,997	9,997
ප්‍රත්‍යාගණිත සංචිත	561,203	561,203	536,119	536,119
රදවාගත් ඉපැයුම්	(181,898)	(197,585)	(210,289)	515,234
විකිණිම සදහා වන දෑහි සංචිත	(465,956)	(465,956)	(465,956)	(227,560)
	890,317	**874,630**	**836,842**	**1,800,761**
ජංගම නොවන වගකීම්				
දිගුකාලීන වගකීම්	586,126	492,426	492,426	500,426
විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම්	4,013	3,796	3,298	18,697
	590,139	**496,222**	**495,724**	**519,123**
ජංගම වගකීම්				
වෙළඳ හා ගෙවිය යුතු දෑ	36,824	42,317	46,502	81,305
පොළී ගෙවිය යුතු ජංගම වගකීම්	4,000	97,794	97,793	101,020
උපචිත බැංකු ණය පොළී	1,146	2,198	21,768	
මුදල් හා මුදල් සමාන දෑ	-	-	14,181	28,653
	41,970	**142,308**	**180,244**	**210,978**
මුළු හිමිකම් එා වගකීම්	**1,522,426**	**1,513,160**	**1,512,810**	**2,530,863**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

විස්තීරණ ආදායම් හා රදවාගත් ඉපැයුම් ප්‍රකාශනය

2014 සිට 2018 දක්වා දෙසැම්බර් 31 න් අවසන් වර්ෂ සඳහා

	2018	2017	පුනප්‍රකාශිත 2016	2015
	රු.'000	රු.'000	රු.'000	රු.'000
ආදායම්	36,064	49,468	64,221	40,571
විකුණුම් පිරිවැය	(316)	(16,215)	(66,525)	(50,781)
දළ ලාභය/(අලාභය)	**35,748**	**33,254**	**(2,304)**	**(10,211)**
වෙනත් ආදායම්	15,375	22,217	91,542	60,043
බෙදාහැරීම් වියදම්	-	(272)	(292)	(1,198)
පරිපාලන වියදම්	(16,883)	(20,524)	(41,172)	(30,461)
මූල්‍ය වියදම්	(14,652)	(16,501)	(15,704)	(15,334)
බදු පෙර ලාභය/(අලාභය)	**19,589**	**18,174**	**32,070**	**2,839**
බදු පිරිවැය	(3,630)	(2,877)	(369)	(255)
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)	-	586	(995,620)	140,870
පෙර වර්ෂ ගැලපීම්	(271)	(3,180)	-	-
බදු පසු ලාභය	**15,687**	**12,703**	**(963,181)**	**143,454**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.